විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය தலைமுறையொன்றின் பெருமிதம் Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2020 උපදෙස් II

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2022.03.09

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2020 අනුව මාර්ගගත ක්‍රමයට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම සඳහා වන උපදෙස් මාලාව (II)**

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2020 අනුව මාර්ගගත ක්‍රමයට වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම පිළිබඳව නිකුත් කරන ලද 03/2021 හා 2021.01.29 දිනැති උපදෙස් ලිපියට වැඩිමනත් වශයෙනි.

1. විශ්‍රාමිකයෙකු මියගිය විටෙක කලත්‍රයා හෝ අනත්දරුවන් වෙත වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙනුයේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කරන ලද වැටුප හා විශ්‍රාම වැටුප් සහිත දීමනා සඳහා පමණි. එබැවින් පහත සඳහන් සේවාවන්වල දායකයින්ගේ තොරතුරු දත්ත පද්ධතිය වෙත ඇතුළත් කිරීමේ දී අදාළ දීමනා සඳහා වැන්දඹු අනත්දරු දායක මුදල් අයවී ඇත්ද යන්න පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර, එසේ නොවන දීමනා කිසිවක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය සඳහා අදාළ කර නොගත යුතුය.

- අධිකරණ සේවයේ නිලධාරින්
- අමාත්‍යාංශ ලේකම්වරුන්
- SL 4 වැටුප් පරිමාණය හිමි නිලධාරීන්
- නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්
- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්
- වෛද්‍ය නිලධාරීන්
- හමුදා සේවාවන්හි සාමාජිකයින්
- තැපැල් සේවයේ නිලධාරීන්

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

2. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේ දී පරිලෝකනය කරන ලද වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගොනු පරිශීලනය කර අදාළ අනුමැතිය ලබා දීම අනිවාර්යය වේ. එසේ පරිලෝකනය කරන ලද ගොනුව දත්ත පද්ධතිය තුළ නොපවතින්නේ නම් අදාළ ගොනුව පරිලෝකනය කර දෙන ලෙස ඉල්ලීමක් wop@pensions.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර එය පරිලෝකනය කිරීමෙන් පසුව පරීක්ෂා කර බලා තොරතුරු තහවුරු කර ගෙන අනුමැතිය ලබා දිය යුතු ය.

3. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු ගෙවීම් සඳහා හිමිකරුවන් ඉදිරිපත් වූ විට ගැටලු නොමැති නම් එම මාසයේ දී ම අදාළ ගෙවීම් කටයුතු සඳහා දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

4. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රම වැටුප් හිඟ මුදල් (දත්ත පද්ධතියට අනුව) රු.500,000.00 ට වඩා වැඩි අවස්ථාවලදී මාර්ගගත දත්ත පද්ධතියේ අයදුම්පත්‍රය ද එම පද්ධතිය හරහා සාමාන්‍ය පරිදි ඉදිරිපත් කර, විශ්‍රාම වැටුප් ගොනුව පරීක්ෂා කර බැලීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු ය.

5. සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන්ගේ කලත්‍රයින්/අනත්දරුවන් උදෙසා වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේ දී විශ්‍රම වැටුප් චක්‍රලේඛ 10/2009 හා 10/2009 (සංශෝධන 1) අනුව අදාළ පරිදි වැන්දඹු අනත්දරු දායක මුදල් අය කර ඇති බවට තහවුරු කර ගත යුතුය.

6. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2020 අනුව, මාර්ගගත ක්‍රමයට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම සඳහා නිකුත් කරන ලද 2021.01.29 දිනැති පළමු උපදෙස් මාලාවේ 5.1 ප්‍රකාරව කටයුතු කිරීමේ දී, <u>නම්වල පවතින සුළු වෙනස්කම් (ඉස්පිලි / පාපිලි වෙනස්කම්, එකම වරනැගීම වුවත් නමෙහි අකුරු වෙනස්වීම, පෙළපත් නාමයන් නමෙහි ඉදිරියට හා පසුපසට යෙදීම, විවාහයෙන් පසුව ස්වාමිපුරුෂයාගේ නම බිරිඳ විසින් භාවිතා කිරීම )</u> සඳහා දිවුරුම් ප්‍රකාශ ප්‍රමාණවත් වුව ද, නම සම්පූර්ණයෙන් වෙනස් වීම, නමේ කොටසක් වෙනස් වීම, වාසගම වෙනස් වීම වැනි නමෙහි පැහැදිලි වෙනසක් සඳහා හැම අවස්ථාවකදීම එම නමෙහි වෙනස සඳහා නෛතිකව කටයුතු කර ගැනීමෙන් පසුව පමණක් අයදුම්පත් සඳහා අනුමැතිය ලබා දිය යුතුය. ඒ සඳහා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් නැත.

7. තොරතුරු පද්ධතිය වෙත දත්ත ඇතුළත් කිරීමෙන් පසුව ලබා ගන්නා අයදුම්පතෙහි (SOURCE DOCUMENT) විෂය නිලධාරියාගේ අත්සන සමඟ නම හා තනතුර ද, නිර්දේශය හා අනුමැතිය ලබා දෙන නිලධාරීන්ගේ අත්සන සමඟ නිලමුද්‍රාව ද සටහන් කිරීම අනිවාර්යය වන අතර, එසේ කිරීමෙන් පසුව පමණක් අයදුම්පත විශ්‍රාම වැටුප් ගොනුවට ඇතුළත් කළ යුතුය.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 1. ලේකම්, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.

2. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.

3. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.